**තම්බලගමුව ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 16 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තම්බලගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| ස්ථාවර වත්කම් | 54,428,824 | ස්ථාවර වත්කම් ලේඛනය | ස්ථාවර වත්කම් ලේඛනය, අවසාන ගිණුම් පිළියෙල කිරීම සඳහා පමණක් ඇතුළත් කරනු ලබන ලේඛනයක් නොව වත්කම්වල සියලුම විස්තර ඇතුළත් ලේඛනයක් ලෙස පවත්වාගෙන යා යුතු වේ. | ස්ථාවර වත්කම් සඳහා වූ ලේඛනය අවසාන ගිණුම් පිළියෙල කිරීමට හැකි ආකාරයෙන් ගිණුම්වල වටිනාකම පමණක් සඳහන් කර තිබුණි. වාහන හැර අනෙකුත් සියලුම වත්කම් වටිනාකම් තක්සේරු කමිටුව ස්ථාපිත කර එමගින් නැවත ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රමාදය සිදු වී තිබුණි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

| | නීතීරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ IX පරිශිෂ්ඨයේ 180 වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් කිරීම වැනි නිලධාරීන් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් රාජකාරී පවරා තිබූ නමුත් ඔවුන්ගෙන් අයකළ යුතු ඇප මුදල් වටිනාකම කොපමණද යන්න තීරණය නොකිරීම නිසා ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | ඇප මුදල් වටිනාකම කොපමණද යන්න තීරණය කර අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඇප මුදල් ගෙවා අදාළ රාජකාරී කිරිම සඳහා නිලධාරීන් ඉදිරිපත් නොවීම නිසා මෙයට අනුකූලව අයකළ යුතු ඇප මුදල් ප්‍රමාණය තීරණය නොකළ බව දැනුම් දෙමි. |
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන පනතේ 203 වගන්තිය | සෑම වර්ෂයක් පාසාම සියළුම වාහන සඳහා වාහන ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. එසේ වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 06 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී වාහන ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | වාහන 06 සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන ඒ පිළිබඳව දැනුම් දිය යුතු වේ. | වාහන බලපත්‍ර ලබා නොගත් සියළුම වාහන සඳහා ඉක්මණින් වාහන ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කරන බව ඔබට දැනුම් දෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.745,678 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,719,558 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 ලැයිස්තුගත කළ ආදායම් | 2017 අයකළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම් | 2016 ලැයිස්තුගත කළ ආදායම් | 2016 අයකළ ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 11,050 | 6,477 | 6,344 | 132 | 11,019 | 6,502 | 6,348 | 153 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 1,463 | 913 | 905 | 8 | 1,250 | 1,024 | 1,024 | - |
| (iii) | අනෙකුත් | 4,501 | 3,600 | 3,058 | 543 | 2,321 | 2,141 | 1,906 | 235 |

(අ) සමාලෝචිත වර්ෂයේ හිඟ කුලී පසුගිය වර්ෂයට වඩා රු.21,000 කින් අඩු වී තිබුණි. තවද, බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් හිඟ මුදල් පිළිවෙලින් රු.8,000 ක් සහ රු.308,000 කින් වැඩි වී තිබීම එම ආදායම් අයකර ගැනීමේ කටයුතු මන්දගාමී අයුරින් සිදු වී තිබූ බව අනාවරණය කරයි.

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින නිශ්චල දේපල හඳුනාගෙන ඒ සඳහා වාර්ෂික වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | දේපල සඳහා වාර්ෂික වටිනාකම තක්සේරු කර අයකිරිමට කටයුතු කළ යුතු වේ. | සභාවේ තීරණ අනුව වරිපනම් බදු අයකරන ස්ථාන තෝරාගෙන පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල කමිටුවේ උපදෙස් අනුව තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට බදු තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව ඔබ වෙත දැනුම් දෙමි. |

### 2.2.3 කුලී ආදායම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින මස් කඩ වලින් හිඟ බදු ආදායම් සමාලෝචිත වර්ෂය දක්වා රු.228,790 ක් වුවත් මෙම හිඟ මුදල් විගණන දිනය වන 2019 මැයි | හිඟ කුලී අයකරනු ලබන අතර ඉදිරියේදී හිඟ කුලී ඇති නොවන ආකාරයෙන් අයකිරීම් සිදු කළ යුතු වේ. | 2018 සහ 2019 වර්ෂවලදී සතුන්ට ඇති වූ රෝග හේතුවෙන් මස්කඩ වල මෙහෙයුම් මන්දගාමීව පැවතුණි. එනමුත් දැන් එම තත්ත්වය වෙනස් වී මස්කඩවල මෙහෙයුම් තරමක් |

| | | |
|---|---|---|
| 15 දින වන විටත් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | | වර්ධනය වෙමින් පවතින බැවින් අදාළ මස් කඩ වලින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව දැනුම් දෙමි. |

**2.2.4 මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | 2017 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු, 2019 මාර්තු මාසයේදී මුළුමනින්ම ලබාගෙන ඒ ආකාරයෙන් 2018 වර්ෂයේ මුද්දර ගාස්තු ලබාගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව ඔබ වෙත දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සභා බල ප්‍රදේශයේ එකතු කරනු ලබන කසළ පාලම් පෝට්ට ආරු ප්‍රදේශයේ කැළෑ පෙදෙසක බැහැර කරමින් තිබූ අතර, එහි වෙසෙන අලි ඇතුන් මෙම කසළ කෑමට ගනු ලබන බැවින් එම සතුන්ගේ ජීවිත හානි සිදුවීමේ අවස්ථා උද්ගත වේ. | අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාළ අවසරයන් ලබා වන සතුන්ට හිංසා නොවන අයුරින් ක්‍රියාත්මක කළ යුතු මෙන්ම ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඔබ විසින් ලබාගෙන ඇති තාවකාලික බලපත්‍ර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | සභා බල ප්‍රදේශයේ එකතු කරනු ලබන කසළ “පාලම් පෝට්ට ආරු සිංහ කන්ද” යන ප්‍රදේශයේ බැහැර කරන බැවින් එහි බලපෑමෙන් පරිසරය සුරැකීමේ අරමුණින් ප්‍රාදේශීය සභාව විසින් මාසිකව එක් වතාවක් JCB යන්ත්‍රය මඟින් පොළොවට සමතලා කරන බොරළු අතුරා තුනී කර තිබුණි. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්නායක හඳුනාගෙන නොතිබුණි. | තමන් විසින් හඳුනාගත් තිරසාර සංවර්ධන ඉලක්කවලින් වැඩසටහන් නිර්නායක විගණනයට ඉදිරිපත් කර එහි ප්‍රගති වාර්තාවද ඉදිරිපත් කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාව යටතට ගැනෙන තිරසාර සංවර්ධනයේ එක් ඉලක්කයක් වන පරිසරය හා අවට ආරක්ෂා කිරීම යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවතී. විශේෂයෙන්, විධිමත්ව ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම, ගස් රෝපණ වැඩසටහන්, කඩොලාන ශාක ආරක්ෂා කිරීම් වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කරනු ලබන අතර මේ පිළිබඳව පාසල් ගුරුවරුන් සහ ශිෂ්‍යයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක විය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් 2012 වර්ෂයේදී කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබාගත් රු.11,949,925 ක ණය මේ දක්වා ගෙවා නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම ණය නියමිත කාල පරාසය තුළ ගෙවීමට කටයුතු කළ යුතු වේ. | කාර්යාල ගොඩනැගිල්ල සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ගෙවීම සඳහා පසුගිය වර්ෂයේ ප්‍රති ලැයිස්තුගත කර ඒ අනුව 2018 නොවැම්බර් මාසයේ සිට නිසි අයුරින් ගෙවීම් සිදුකරන බව ඔබ වෙත දැනුම් දෙමි. |
| (ආ) | 2013 සහ 2014 වර්ෂවලදී සභාව විසින් භාවිතා කරමින් තිබූ රිසිට් පොත් (ලදු පොත්) 2015 වර්ෂයේදී අතුරුදහන් වීම නිසා එමඟින් ලැබූ මුදල්, රිසිට් පොත හැර නිලධාරියා විසින් සභාවට භාර දී නොතිබුණි. වර්ෂ දෙකකට අධික කාලයක් ඉක්ම ගොස් තිබුණද, මේ පිළිබඳව පළාත් මූල්‍ය රීති මාලාවේ රීති 71.3 ප්‍රකාරව අදාළ සේවකයන් හට විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, රිසිට් | විනය පරීක්ෂණ අනුව ක්‍රියාකිරීමට කටයුතු කළ යුතු වේ. | ආයතන සංග්‍රහයේ XLVIII පරිශිෂ්ඨයට අනුව මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණය අවසන් වී ඇති බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| | පොත් මඟින් සිදු වූ පාඩුව ගණනය කර ඔවුන්ගෙන් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | | |
| (ඇ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 09/2009(1) දරන 2009 ජුනි 17 දිනැති චක්‍රලේඛයේ (ii) ඡේදය ප්‍රකාරව ආයතන ප්‍රධානියා ඇතුළු සියළුම නිලධාරීන් තම සේවා ස්ථානය වෙත පැමිණීම සහ පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කළ යුතු බව සඳහන් වුවත්, සභාවේ ලේකම්වරයා එලෙස ක්‍රියාකර නොතිබුණි. | චක්‍රලේඛය අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු වන අතර සභාවේ ලේකම්වරයා ක්ෂේත්‍ර නිලධාරියෙකු බව තහවුරු කළ යුතු වේ. | සභාවේ ලේකම්වරයාත් එක් ක්ෂේත්‍ර නිලධාරියෙකු බැවින් සම්බාධිත අමාත්‍යාංශයේ බලධාරීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ලැබෙන ඇරයුම් නිසා නිවසේ සිට සෘජුවම රැස්වීම්වලට යාමට සිදුවන බැවිනුත්, මහජනතාවගේ සුබසාධනය උදෙසා, කාර්යාලයට පැමිණීමට පෙර ඇතැම් ක්ෂේත්‍ර රාජකාරි සිදු කළ යුතු බැවිනුත්, එම දිනවල පමණක් ඇඟිලි සලකුණු තැබිය නොහැකි වී තිබූ බව ඔබ වෙත දන්වා සිටිමි. |
| (ඈ) | සේවය හැර ගිය සේවකයෙකුගෙන් අයකර ගත යුතු රු.2,500 ක් ණය ශේෂය එම සේවකයාගෙන් හෝ ඔහුගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | සේවය හැර ගිය සේවකයන්ගෙන් අයවිය යුතු මුදල අයකිරීම සඳහා කඩිනමින් ක්‍රියාකරනු ලබන බවට ඔබ වෙත දන්වා සිටිමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 නිෂ්කාර්යව පවතින වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවේ ඇති යතුරු පැදි 02 ක්, රෝද දෙකේ ට්‍රැක්ටරය, රෝද හතරේ ට්‍රැක්ටරය ආදිය අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු නොකර වර්ෂ 04 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන භාවිතා කිරීමටත් අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ඔබ විසින් අනාවරණය කළ වාහනවලින් අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | පළාත් නිශ්චිත සංවර්ධන ආධාර යටතේ, ඝන අපද්‍රව්‍ය වෙන්කරගැනීමේ මධ්‍යස්ථානය රු.918,057 ක වටිනාකමින් ඉදිකර කොන්ත්‍රාත්කරු විසින් 2018 දෙසැම්බර් 12 දින භාර දී තිබුණි. එසේ වුවත්, විගණන දිනය වන 2019 මැයි 15 වන විටත් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | භාවිතා නොකර පවතින මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | ඝන අපද්‍රව්‍ය වෙන්කර කසළ කළමනාකරණය නිසියාකාරව සිදුකිරීමට අදාළ ගොඩනැගිල්ල කඩිනමින් භාවිතයට ගනු ලබන බව දන්වා සිටිමි. |

### 3.3.2 වාර්ෂික තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ තොග සමීක්ෂණයේදී සභාව විසින් නඩත්තු කරනු ලබන පුස්තකාල තුනෙහි පොත් 667 ක් සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් නොකිරීම පිළිබඳව අනාවරණය කරන ලද නමුත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුස්තකාල පොත්වල ඌනතාවයන් සිදු නොවන ආකාරයෙන් අභ්‍යන්තර පාලනය ඇති කළ යුතු වේ. | පොත් ලබා ගනු ලැබූ පාඨකයන් විසින් ආපසු ලබා නොදුන් පොත් කඩිනමින් භාර දීමට ලියාපදිංචි තැපෑලෙන් අදාළ පුද්ගලයින්ට ලියුම් යවා ඇත. අනෙකුත් පොත් සඳහා ඒ සම්බන්ධ පුද්ගලයන්ගෙන් පොත් හෝ ඊට සමාන වටිනාකම අයකිරීමට දන්වා සිටිමි. |

### 3.3.3 අරපිරිමැසුම්දායක නොවන ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1980 වර්ෂයේ අංක 46 දරන සේවක භාරකාර අරමුදල ප්‍රකාරව සේවකයන් සඳහා භාරකාර අරමුදලේ දායක මුදල් අදාළ මාසයේ අවසාන දිනට ප්‍රථම අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. එසේ වුවත්, සභාව විසින් 2012 ජනවාරි සිට 2016 අප්‍රේල් දක්වා සේවය කළ සේවකයන් සඳහා සේවක භාරකාර අරමුදලට දායක මුදල් එයට වගකිව යුතු සේවකයන් ගෙවීම පැහැර හැරීම නිසා සභාව | දඩ ගාස්තු සභා අරමුදලෙන් ගෙවිය නොහැක. එබැවින්, මේ සඳහා හේතු පරීක්ෂා කොට වගකිව යුතු අයගෙන් අයකර ගත යුතු වේ. | 2012 වර්ෂයේ සිට 2016 දක්වා කාලපරිච්ඡේදයේ වැඩ බැලීමේ සේවකයන් ලෙස රාජකාරී කළ අය සඳහා වැටුපට සරිලන ආකාරයෙන් සභාවේ අරමුදල් පහසුකම් නොමැති වීමෙන් සේවක භාරකාර අරමුදලට දඩ මුදල් ගෙවීමට සිදු වී තිබුණි. එසේ වුවත්, වර්තමානයේ වහාම වැඩ බලන සේවකයන්ට වැටුප් ගෙවන බව දන්වා සිටිමි. |

රු.52,673 ක් දඩ මුදල් ලෙස ගෙවා තිබුණි.

## 3.4 ප්‍රසම්පාදනය

### 3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව සම්පාදන සැලැස්ම සෑම වර්ෂයකම පිළියෙල කළ යුතුය. | 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබන කාරණා සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලබන බව දන්වා සිටිමි. |

### 3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **පොදු වෙළඳපොල ගොඩනැගිල්ල ඉදිකිරීම**<br>පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රා දේශීය සභාව ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ රු.10,743,042 ක කොන්ත්‍රාත් වටිනාකමින් ඉදි කරමින් පවතින වෙළඳපොල ගොඩනැගිල්ල පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) මෙම කාර්යය 2018 ජනවාරි 22 දින අවසන් කර සභාවට භාරදිය යුතුව තිබුණි. එසේ වුවත්, කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු විගණන දිනය වන 2019 මැයි 15 දින වන විටත් අවසන් කර නොතිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබූ අතර රු.537,152 ක් වටිනා ප්‍රමාද ගාස්තු ද අයකර නොතිබුණි. | ගෙවීම් වවුචර් සහතික කිරීමේදී ඉටු නොකළ කාර්යයන් පැවති විට ඒවා සහතික කිරීමෙන් සිදුවන අහිතකර ප්‍රතිඵල සහතික කරන අය විසින් භාරගත යුතු වේ. එසේම, අවසන් නොවූ කාර්යයන් සඳහා ගෙවීම් වවුචර්වලින් ඉවත් කළ | මේ පිළිබඳව තාක්ෂණික නිලධාරීන්ගෙන් පැහැදිලි කිරීම් විමසීමේදී “අදාළ කාර්යය සඳහා ගෙවීම් වවුචර් කලින්ම යවා තිබූ බැවින් කාල ප්‍රමාදය සඳහා ගාස්තු අයකර ගත නොහැකි වී තිබුණි.” යනුවෙන් පවසන ලදී. තවද, රු.මිලියන 10 කට වැඩි කර්මාන්ත සඳහා පළාත් පාලන ආයතනය |

| | | | |
|---|---|---|---|
| | | යුතු වේ. තවද, ප්‍රමාද ගාස්තු පිළිබඳ පරීක්ෂා කොට අයකිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතු වේ. | විසින්ම කටයුතු කරන බැවින් ඔවුන් විසින් ද ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවත්, ඇප මුදල් මේ දක්වා නිදහස් නොකළ බැවින් ඇප මුදලින් ප්‍රමාද ගාස්තු අයකිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට අප විසින් දැනුම් දෙනු ලබන බව දන්වා සිටිමි. |
| (ii) | සීලින් (ceiling) 81.5 $m^3$ පොළොවට ඇල්ලූ ටයිල් ස්කර්ටින් (skirting) ආදිය නිසි අයුරින් අල්ලා නොතිබියදී සහ බිත්ති පින්තාරු කිරීම් පුපුරා තිබියදී මේවා පිළිබඳ අවධානය යොමු නොකර ගෙවීම් සිදු කිරීමට තාක්ෂණික නිලධාරීන්ගේ වාර්තා නොලබා සභාවේ ලේකම්වරයා විසින් නිර්දේශ කර තිබුණි. | ඉදිකළ ගොඩනැගිලිවල දක්නට ලැබූ අඩුපාඩු නිවැරදි කළ යුතු අතර ගෙවීම් නිර්දේශ කිරීමේදී වගකිව යුතු නිලධාරීන් සමඟ සාකච්ඡා කළ යුතු වේ. | අදාළ වෙළඳපොල ගොඩනැගිල්ලේ ඔබ විසින් අනාවරණය කර තිබූ කාර්යයන් සඳහා වූ ගෙවීම් වවුචරයේ තාක්ෂණික නිලධාරී විසින් සිදුකළ නිර්දේශ පදනම්ව ලේකම්වරයා විසින් අදාළ කොන්ත්‍රාත්කරු ඉල්ලීම් සිදුකළ බැවින් පළාත් පාලන කොමසාරිස්වරයාට නිර්දේශ ලිපි ලබා දී තිබුණු බව දන්වා සිටිමි. |